**පොලිස් මාධ්‍ය කොට්ඨාසය**
**பொலிஸ் ஊடகப் பிரிவு**
**POLICE MEDIA DIVISION**
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.07.29 පැය 0500 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/1478 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**අපරාධ රැසකට සම්බන්ධ සැකකරුවෙකු කටුනායක ගුවන්තොටුපලේදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අත්අඩංගුවට.**

2025.07.28 වන දින රාත්‍රි කාලයේ කටුනායක ගුවන්තොටුපල පැමිණීමේ පර්යන්තයේදී ඉන්දියාවේ සිට මෙරටට ගුවන් මගින් පැමිණි විවිධ අපරාධ සම්බන්ධයෙන් පොලිසියට අවශ්‍ය කර සිටි සැකකරුවෙකු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ගුවන්තොටුපල ඒකකයේ නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 31 ක් වන වැලිගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෙම සැකකරු පහත සඳහන් අපරාධයන් සම්බන්ධයෙන් අත්අඩංගුවට ගැනීම සඳහා අවශ්‍ය කර සිටි සැකකරුවෙකු වේ.

01. 2025.04.29 වන දින හිරණ පොලිස් වසමේ යතුරුපැදියකින් පැමිණ ටී-56 අවියකින් වෙඩි තබා පුද්ගලයෙකු ඝාතනය කිරීමේ සිදුවීමේ ප්‍රධාන වෙඩික්කරු ලෙස හඳුනා ගෙන ඇත.

02. 2025.06.05 වන දින මට්ටක්කුලිය පොලිස් වසමේ ටී-56 ගිනි අවියකින් හා 9mm වර්ගයේ ගිනි අවියකින් වෙඩි තබා පුද්ගලයෙකු ඝාතනය කිරීමේ සිදුවීමේ ටී 56 ගිනි අවිය භාවිතා කල වෙඩික්කරු ලෙස හඳුනා ගෙන ඇත.

03. 2025.06.29 වන දින පානදුර දකුණ පොලිස් වසමේදී යතුරුපැදි කොටස් අලෙවිසැලකට යතුරුපැදියකින් පැමිණ ටී-56 වර්ගයේ ගිනි අවියකින් වෙඩි තබා පුද්ගලයෙකුට තුවාල සිදු කිරීමේ සිදුවීමේ වෙඩික්කරු ලෙස හඳුනාගෙන ඇත.

04. 2024.04.15 වන දින කොටවිල පොලිස් වසමේ යතුරුපැදියක් සොරකම් කිරීම.

05. 2024.04.22 වන දින මාලිම්බඩ පොලිස් වසමේ භාණ්ඩ මිලදී ගන්නා මුවාවෙන් වෙළඳසැලට පැමිණ රුපියල් 80000/= ක් වටිනා රන් මාලයක් කොල්ලකෑම.

06. 2024.07.23 වැලිගම පොලිස් වසමේ මාර්ගයේ ගමන් ගත් කාන්තාවකගේ රුපියල් 52000/=ක් වටිනා ගෙල බැඳි රන් මාලයක් කොල්ලකෑම.

07. 2024.07.24 වන දින මාලිම්බඩ පොලිස් වසමේ යතුරුපැදියකින් පැමිණ කාන්තාවකගේ ගෙල බැඳි රුපියල් 150,000/= ක් වටිනා රන්මාලයක් කොල්ලකෑම.

08. 2024.08.24 වන දින තිහගොඩ පොලිස් වසමේ මාර්ගයේ යමින් සිටි කාන්තාවකට අවි පෙන්වා බිය ගන්වා රුපියල් 450,000/= වටිනා රන් මාලයක්, රුපියල් 35,000/= ක් වටිනා පෙන්ඩනයක් හා රුපියල් 450,000/= වටිනා අත් පළඳනාවක් කොල්ලකෑම.

09. 2024.08.05 වන දින කොටවිල පොලිස් වසමේ කාන්තාවක්ගේ ගෙල බැඳි රන් මාලයක් කොල්ලකෑම.

10. 2024.08.08 වන දින වැලිගම පොලිස් වසමේ පුද්ගලයකුට තියුණු ආයුධයකින් පහරදී බරපතල තුවාල සිදු කිරීම.

11. 2024.08.11 වන දින මාලිම්බඩ පොලිස් වසමේ යතුරුපැදියකින් පැමිණ රුපියල් 95000/= ක් වටිනා රන්මාලයක් හා රන් පෙන්ඩනයක් කොල්ලකෑම.

12. 2024.08.12 වන දින වැලිගම පොලිස් වසමේ මාර්ගයේ ගමන් කරමින් සිටි කාන්තාවකගේ ගෙලබැඳි රුපියල් 90000/= ක් වටිනා රන් මාලයක් යතුරුපැදියකින් පැමිණ කොල්ලකෑම.

13. 2024.08.12 කොටවිල පොලිස් වසමේ යතුරුපැදියකින් පැමිණ මාර්ගයේ ගමන් කරමින් සිටි කාන්තාවකගේ ගෙල බැඳි රන් මාලයක් කොල්ලකෑම.

සැකකරු වැඩිදුර විමර්ශන සඳහා කළුතර අපරාධ කොට්ඨාසය වෙත භාරදීමට කටයුතු කර ඇත.මෙම අවස්ථාවට අදාල ඡායාරූප කිහිපයක් හා වීඩියෝ පටයක් මේ සමග ඔබ වෙත එවමි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**